# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. **CEA/NC/AD/PNC/TL/B17/ 28043 /2025**
ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref.
දිනය / திகதி / Date 2025.03.14

උතුරුමැද පළාත් කාර්යාලය,
අංක 388/40, හරිස්චන්ද්‍ර මාවත,
අනුරාධපුර.

ආර්.එම්.විරන්ත ලහිරු ගුණවර්ධන මහතා,
පහමුනේගම, ගාලදිවුල්වැව,
නොච්චියාගම.

මහත්මයාණෙනි,

**පාරිසරික ආරක්ෂණ බලපත්‍රය**

ඉහත බලපත්‍රය ලබා ගැනීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද 2025.01.20 දිනැති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම් පත්‍රය අනුව 2025.03.14 දිනැති අංක **B 24440 (R0)** දරණ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය මේ සමඟ එවමි.

මේ සමඟ එවනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ අඩංගු වන යම් කොන්දේසියක් උල්ලංඝණය කිරීම හෝ ඒ කොන්දේසිය අනුව කටයුතු කිරීම පැහැර හැරීම 1988 අංක 56 සහ 2000 අංක 53 පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ පාරිසරික පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බව කරුණාවෙන් සලකන්න.

මෙම බලපත්‍රය නැවත අළුත් කිරීමේ අයදුම්පතක් බලපත්‍රයේ සඳහන් **අවලංගු වන දිනට මාස තුනකට පෙර** මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර අදාල බලපත්‍රය නැවත අළුත් කරවා ගන්නා ලෙස මෙයින් දන්වමි.

මේ සම්බන්ධයෙන් මෙම අධිකාරියට යොමු කරන සියළුම ලියකියවිලි වල ඉහත සඳහන් අපගේ යොමු අංකය සඳහන් කල යුතුය.

මෙයට,
විශ්වාසී,

සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්/ බලයලත් නිලධාරි
මධ්‍යම පරිසර අධිකාරිය

පිටපත් :-

01. ලේකම්. ප්‍රාදේශීය සභාව, නොච්චියාගම. (මෘදු පිටපත)
02. අධ්‍යක්ෂ (පරිසර දූෂණ පාලන), මධ්‍යම පරිසර අධිකාරිය, බත්තරමුල්ල. (මෘදු පිටපත)




| Chairman | Tel : 2872361, 2872348<br>Fax : 2872347 | Director General | Tel : 2872359<br>Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2872419, 2873448 | Hotline for Inquiries : 2888999<br>Environmental Complaints: 1981 |
|---|---|---|---|---|---|---|

| D.D.G | HRD.Admin. & Finance | Envt. Protection | Envt. Mgt. & Assessment | Envt. Edu. & Awareness | Waste Managment | Regional Oper. |
|---|---|---|---|---|---|---|
| | Tel: 2865296 Fax : 2877515 | Tel :2873453 Fax : 2872605 | Tel :2872388 Fax : 2872296 | Tel : 2872297 Fax : 2872609 | Tel : 2872409 Fax : 2882152 | Tel : 2872370<br>Fax : 2872275 |

පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment

අපේ යොමුව :- **CEA/NC/AD/PNC/TL/B17/28043/2025**

No. CEA B 091094

බලපත්‍ර අංකය :- **B 24440 (R0)**

**1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත**
**23 ආ. වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම් සඳහා**
**පාරිසරික ආරක්ෂණ බලපත්‍රය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ,

**ආර්.එම්.විරන්ත ලහිරු ගුණවර්ධන** යන අය විසින් මුදිතාගම, නොච්චියාගම **(GPS කණ්ඩාංක 44P 0414630 E, 0914391 N)** යන ස්ථානයේ හි **"සිලෝන් ඇග්‍රි බිස්නස් (පී.වී.ටී) එල්ටිඩී"** යන නමින් පවත්වාගෙන යනු ලබන **සේවකයන් 25ක් හෝ ඊට වැඩි ගණනක් සේවය කරන ස්වභාවික කෙඳි ආශ්‍රිත කර්මාන්තය** වෙත පමණක් වෙත පමණක් අංක 2264/17 හා 2022.01.27 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධිත අංක 1534/18 හා 2008.02.01 දිනැති ගැසට් නිවේදනයේ නියම කර ඇති 2008 අංක 01 දරණ ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ත්ව) නියෝග සහ අංක 924/12 සහ 1996 මැයි 23 දින දරණ ලේඛණයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග මගින් නියමිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව, එකී අපද්‍රව්‍ය මුදාහැරීම/ තැන්පත් කිරීම සහ/ හෝ වායුමෝචනයන්/ කම්පනයන්/ ශබ්දය පිට කිරීම සඳහා මෙයින් බලය පවරමි.

මීට ප්‍රථමයෙන් ප්‍රතික්ෂේප කිරීමක් හෝ අත්හිටුවීමක් නොවී නම්, මෙම බලපත්‍රය **2025.03.14** සිට **2026.03.13** දක්වා වලංගු වේ.

මෙම බලපත්‍රය පසු පිටේ සඳහන් පොදු නියම හා කොන්දේසි වලට සහ විශේෂයෙන් පහත සඳහන් කර ඇති අමතර නියම හා කොන්දේසි වලට යටත් වන්නේය.

**කොන්දේසි :**

01 1.1 මෙම කර්මාන්තයේ සේවාවන් පෙ.ව. 6.00 ත් ප.ව. 6.00ත් අතර කාලය තුළ පමණක් පවත්වා ගත යුතුය.

1.2 මෙම කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ජනිත වන ශබ්ද මට්ටම අදාල ඉඩමේ මායිම්වලදී ඉහත සඳහන් සේවා කාලය තුළ 55dB (A) හෝ එයට අඩුවෙන් පමණක් පවත්වා ගත යුතුය

02 සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී නිකුත් වන ගෘහාශ්‍රිත අපජලය (Domestic Waste water) පූතික වල හරහා මතුපිටින් වැසු උරා ගැනීමේ වල වෙත (Soakage Pit) යොමු කල යුතුය.

03 සංශෝධිත 1980 අංක 47 දරණ පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 2034/36 දරණ 2017.09.01 දිනැති රෙගුලාසි වලට අනුව,ප්ලාස්ටික් අඩංගු කසල හෝ වෙනත් පහසුවෙන් දැවෙන ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමපිළිස්සීමට සැලැස්වීම,පිළිස්සීමට ඉඩදීම හෝ අවසර දීම සිදු නොකළ යුතුය.

**2025.03.14**

**සභාපති/අධ්‍යක්ෂ ජනරාල්/බලයලත් නිලධාරි**
**මධ්‍යම පරිසර අධිකාරිය**

04 4.1 කොහු කර්මාන්තයෙන් නිකුත් වන දූවිලි අංශු විසිරීම අවම කිරීම සඳහා ජලය ඉසින උපකරණය කර්මාන්තය ක්‍රියාකාරිත්වයේ පවතින සෑම විටම ක්‍රියාකාරීව පැවතිය යුතුය.

4.2 කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ජනනය වන වන පලායිත අවලම්භිත අංශු සාන්ද්‍රනය 450 $\mu g/m^3$ ට වඩා වැඩි නොවිය යුතු අතර ප්‍රමිතියට අනුකූල වන පරිදි මුළු අවලම්භිත අංශු සාන්ද්‍රනය පවත්වාගෙන යාමට අවශ්‍ය තෙත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යා යුතුය.

4.3 කොහු කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ජනනය වන වායු දූෂකාරක අවට පරිසරයට විසිරීම වලක්වා ගැනීම පිණිස කර්මාන්තය වටා ප්‍රමාණවත් ආරක්ෂණ කලාපයක් (Buffer Zone) පවත්වා ගත යුතුය.

05 මෙම කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ජනිත වන සියලුම ඝන අපද්‍රව්‍ය (සේවක සේවිකාවන්ගේ ගෘහස්ථ ඝන අපද්‍රව්‍ය ඇතුලත්ව) පහත සඳහන් පරිදි බැහැර කල යුතුය.

5.1 කිසිම ජල මාර්ගයකට. ජලාශයකට හෝ ජල මාර්ගයකට, එකතු විය හැකි ස්ථානයකට බැහැර නොකල යුතුය.

5.2 මෙම කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුය.

5.3 අදාළ ඉඩමේදි හෝ ඉන් පිටතදි කිසිම විටකදී විවෘත භූමියක පිළිස්සීම සිදු නොකල යුතුය.

5.4 එකී ඝන අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස ඉහත සඳහන් පරිදි බැහැර කිරීම සම්බන්ධයෙන් කර්මාන්තකරු පෞද්ගලිකවම වගකිව යුතුය.

06 ප්ලාස්ටික්, ප්ලාස්ටික් නිෂ්පාදන, ප්ලාස්ටික් ව්‍යුත්පන්න සහ ප්ලාස්ටික් ව්‍යුත්පන්න ආශ්‍රිත නිෂ්පාදන භාවිතයේදී,සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 2211/51 දරණ 2021.01.21 දිනැති සහ අංක 2341/30 දරණ 2023.07.19 දිනැති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය.

07 කර්මාන්ත ශාලාව තුළ මනා ගෘහ පාලනයක් පවත්වා ගත යුතුය.

08 8.1 2025.01.20 දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරිත්වයේ හෝ යන්ත්‍රසූත්‍ර වල හෝ ඕනෑම වෙනසකිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකල යුතුය.

2025.03.10

සභාපති/අධ්‍යක්ෂ ජනරාල්/බලයලත් නිලධාරි
මධ්‍යම පරිසර අධිකාරිය

8.2 මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නඟින කුමන හෝ අන්දමේ පරිසර දූෂණ තත්වයක් මැඩ පැවැත්වීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවස්ථානුකූලව කරනු ලබන නිර්දේශයන් හා පනවනු ලබන කොන්දේසි ක්‍රියාත්මක කිරීමට මෙම කර්මාන්ත අයිතිකරු සෑම විටකම බැඳී සිටිය යුතුය.

09 මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින් දල මෙමගින් අදාල ප්‍රමිතින්ට අනුකූලව අපද්‍රව්‍ය / අපදියර මුදා හැරීම සහ පරිසරයට වායු දූෂක කාරක ශබ්දය පිට කිරීමට පමණක් එයින් බලය ලැබෙන බැවින්දල මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාමට අදාල පලාත් පාලන ආයතනයෙන් ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු වේ.

10 මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලබන අතර එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එකී ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා පාදක කරගත හැකි ලේඛනයක් නොවන බවද සැලකිය යුතුයි.

11 කර්මාන්තය පිහිටි ඉඩමෙහි අයිතිය හෝ භූමිය සම්බන්ධයෙන් යම් නීති කෘත්‍යයන් රජයේ ආයතනයක් මගින් පවරන හෝ රජයේ ආයතනයක් මගින් පවරා පවත්වාගෙන යන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් මෙම අධිකාරිය දැනුවත් කළ යුතුය.

12 මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ **ආර්.එම්.විරන්ත ලහිරු ගුණවර්ධන** යන අය විසින් **මුදිතාගම, නොච්චියාගම (GPS කණ්ඩාංක 44P 0414630 E, 0914391 N)** යන ස්ථානයේ හි **"සිලෝන් ඇග්‍රි බිස්නස් (පී.වී.ටී) එල්ටිඩී"** යන නමින් පවත්වාගෙන යනු ලබන **සේවකයන් 25ක් හෝ ඊට වැඩි ගණනක් සේවය කරන ස්වභාවික කෙඳි ආශ්‍රිත කර්මාන්තය** සඳහා පමණක් බව සැලකිය යුතුය.

13 යම් කවර හෝ අවස්ථාවකදී අයදුම්කරු විසින් ලබාදුන් පරිසර ආරක්ෂණ බලපත්‍රය අළුත්කිරීමේ අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති තොරතුරු වලින් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තහවුරු වුවහොත් මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අවලංගු කිරීමේ බලය මෙම අධිකාරිය සතුය.

14 මධ්‍යම පරිසර අධිකාරිය මගින් බල රහිත කිරීමක් අත්හිටුවීමක් අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක්වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ (උතුරුමැද පළාත) වෙත භාරදීමට කර්මාන්තකරු පියවර ගත යුතුය.

2025.03.14

සභාපති/අධ්‍යක්ෂ ජනරාල්/බලයලත් නිලධාරි
මධ්‍යම පරිසර අධිකාරිය